**මාතර විශ්ව විද්‍යාල විද්‍යායතනය - 2019**
**-----------------------------------------------**

## 1.1 තත්ත්වාගණනය කළ මතය

**-------------------------------**

මාතර, විශ්ව විද්‍යාල විද්‍යායතනයේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, විශ්වවිද්‍යාල විද්‍යායතනයේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

------------------------------------------------

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

--------------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, විද්‍යායතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය විද්‍යායතනය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා විද්‍යායතනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

විද්‍යායතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය හා සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව, විද්‍යායතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 විගණන විෂය පථය

----------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.
- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස විද්‍යායතනයේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.
- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් විද්‍යායතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ විද්‍යායතනයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ විද්‍යායතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, විද්‍යායතනය ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය.

ගනුදෙනු කළමනාකරිත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරි බලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තා කරන ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතු භාවය පවත්වාගෙන යාම, කළමනාකාරිත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම් කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානු වලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබා ගැනීමට ප්‍රමාණවත් "මනාලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

### 1.5.2 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ සිට ආයතනය අනුගමනය කරන ක්ෂය ප්‍රතිපත්තිය වත්කම් වර්ග 03ක් වෙනුවෙන් සංශෝධනය කර තිබුණු අතර, ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත 03 හි 27 වගන්තිය අනුව ගැලපීම් කිරීමේදී ගණනය කිරීමේ දෝෂයක් හේතුවෙන් ප්‍රාග්ධන ප්‍රදාන ගිණුමේ ශේෂය රු.364,632ක් වැඩියෙන් ද දේපළ පිරියත හා උපකරණ ගිණුමේ ශේෂය එම ප්‍රමාණයෙන් අඩුවෙන්ද දක්වා තිබුණි. | ක්ෂය ගණනය කිරීමේදී පරිගණක, පොත් සහ වෙනත් වත්කම්වලට අදාළව 2015 වර්ෂයටම ක්ෂය කල යුතු වුවත් මිළදී ගත් දිනය පදනම් කරගෙන ක්ෂය ගණනය වීම නිසා අදාල වෙනස ඇති වී තිබේ. | ගිණුම්කරණ ප්‍රමිතියට අනුව නිවැරදිව ගැලපීම් සිදුකළ යුතුය. |

### 1.5.3 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලය විසින් හඳුන්වා දී ඇති ගිණුම් විෂයයන් අනුව ධාරිතා සංවර්ධනය වෙනුවෙන් දරන වියදම් ප්‍රාග්ධන වියදම් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතු වුවද සමාලෝචිත වර්ෂයේදී ස්ථිර පත්වීම් ලාභී නිලධාරියෙකුට ආචාර්ය උපාධිය | විද්‍යායතනයේ පාලක මණ්ඩලයේ අනුමැතියට යටත්ව ධාරිතා සංවර්ධනය සඳහා කරනු ලබන සියලුම වියදම් පුනරාවර්ථනය වියදම් සහ අරමුදල් ලෙස මූල්‍ය ප්‍රකාශන වල දක්වනු ලැබේ | ධාරිතා සංවර්ධනය සඳහා දරන ලද වියදම් ප්‍රාග්ධනිත කළ යුතුය. |

| | | |
|---|---|---|
| වෙනුවෙන් දරන ලද රු.450,000 ක වියදම් පුනරාවර්ථන වියදමක් සේ සලකා ගිණුම්ගත කර තිබුණි. | | |
| (ආ) පසුගිය වර්ෂයට අදාළව වෘත්තීය තාක්ෂණ විශ්ව විද්‍යාලය විසින් ප්‍රතිපූර්ණය කරන ලද රු. 286,000 ක මුදල පෙර වර්ෂයේ ලාභයට ගැලපීම වෙනුවට සමාලෝචිත වර්ෂයේ ආදායම් යටතේ ගිණුම්ගත කර තිබුණි. | 2018 වර්ෂයේ දරණ ලද රු.286,000 වියදම ප්‍රතිපූර්ණය කර දෙන ලෙස ඉල්ලුම් කළද නිපුණතා සංවර්ධන අරමුදලින් ඒ සඳහා කිසිදු ප්‍රතිචාරයක් නොදැක්වීම නිසා 2018 වර්ෂයේ ලැබියයුතු මුදලක් ලෙස ගිණුම්ගත නොකරන ලදි. | උපචිත සංකල්පය අනුගමනය කරමින් ගිණුම් ගත කළ යුතුය. |
| (ඇ) විශ්වවිද්‍යාල විද්‍යායතනයට අනුයුක්තව සේවය කළ නිලධාරිනියක මාසයකට පෙර දැනුම් දීමකින් තොරව සේවයෙන් ඉවත් වීම හේතුවෙන් අය කරන ලද රු. 43,103 ක මසක දල වැටුප වෙනත් ආදායම් ගිණුමට බැර කිරීම වෙනුවට වැටුප් ගිණුමට බැර කර තිබුණි. | වැටුප් ගෙවීම් ගිණුම්ගත කිරීමේදී වැටුප් හා එයට අදාළ වෙනත් වියදම් ගිණුම්වල වාර්තා කරන ලද අතර ඉවත්ව ගිය සේවකයාගෙන් අයකරන ලද මුළු මුදලම වැටුප් හා එයට අදාළ වෙනත් වියදම් වලට බෙදා අදාල ගිණුම්වල වාර්තා කරන ලදි. | වැටුප් හා වේතන යටතේ දරන ලද වියදම් පමණක් එම ගිණුම යටතේ දැක්විය යුතුය. |

## 1.6 නීති රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| (i) මුදල් රෙගුලාසි 110 | සෑම ආයතනයක් විසින්ම මු.රෙ. 102 යටතේ සඳහන් වූ හානි පිළිබඳ විස්තර සටහන් පවත්වා ගැනීම සඳහා හානි පිළිබඳ ලේඛනයක් පවත්වාගෙන යා යුතු වුවත් මාතර විශ්වවිද්‍යාල විද්‍යායතනයේ එසේ ලේඛනයක් පවත්වා ගෙන ගොස් නොතිබුණි. | හානි පිළිබඳ ලේඛනයක් මේ වනතුරු පවත්වා ගෙන නොමැති අතර ඉදිරියේ දී ඒ පිළිබඳව කරුණු සොයා බලා සිදු කිරීමට කටයුතු කරමි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව හානි පිළිබඳ ලේඛනයක් පවත්වා ගත යුතුය. |
| (ii) මුදල් රෙගුලාසි 880 හා 881 | මුදල් රෙගුලාසි ප්‍රකාරව ඇප තැබිය යුතු නිලධාරීන් හඳුනාගෙන ඇප තැන්පත් ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. | අමාත්‍යාංශය මඟින් ඇප තැන්පත් කළ යුතු නිලධාරීන් සහ තැන්පත් කලයුතු මුදල් ප්‍රමාණයන් පිළිබඳව දැනුම්දුන් පසුව ඊට අදාලව කටයුතු සිදුකිරීමට බලාපොරොත්තු වෙමි. | ඇප තැන්පත් කළ යුතු නිලධාරීන්ගෙන් ඇප තැන්පතු ලබා ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (iii) මුදල් රෙගුලාසි 1645 | ආයතනය සතු වාහන සම්බන්ධයෙන් පොදු 267 ආකෘතිය ප්‍රකාරව ලොග් සටහන් පොත් පවත්වාගෙන යා යුතු වුවත් පවත්වාගෙන ගොස් තිබුණු ලොග් පොත් විධිමත්ව නඩත්තු කර නොතිබුණි. | ඉදිරියේදී එය විධිමත්ව පවත්වාගෙන යාමට කටයුතු කරමි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව ලොග් සටහන් පොත් විධිමත්ව පවත්වා ගෙන යායුතුය. |
| (iv) මුදල් රෙගුලාසි 1646 | මුදල් රෙගුලාසි ප්‍රකාරව, 208(4) පොදු ආකෘති පත්‍රයේ ලියන ලද ගමන් පිළිබඳ මාසික සාරාංශයේ මුල් පිටපතක්ද, දෛනික ධාවන සටහන් පිළිබඳ විස්තරද විගණකාධිපති වෙත ඉදිරිපත්කර නොතිබුණි. | දෛනික ධාවන සටහන් පිළිබඳ විස්තර ඉදිරියේදී විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරමි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව ධාවන සටහන් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵල රු.825,352 ක අතිරික්තයක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 627,212 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 1,452,564 ක වර්ධනයක් නිරීක්ෂණය විය. පුනරාවර්තන ප්‍රදාන හා වෙනත් ආදායම් වැඩිවීම මෙම වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) විද්‍යායතනය විසින් පවත්වනු ලබන පාඨමාලා සඳහා සිසුන් බඳවා ගැනීමේ පටිපාටිය අනුව එක් පාඨමාලාවක සම මට්ටමේ සුදුසුකම් සපුරන ලද සිසුන් 35 ක කණ්ඩායමක් විය යුතු වුවත් පසුගිය වර්ෂ 04 හි විලේපනවේදය පාඨමාලාව හදාරන සිසුන් ගණන 02ත් 19ත් අතර පරාසයක හෙවත් සියයට 06 ත් සියයට 54 ත් අතර පරාසයක් ගෙන තිබුණි. | අප ආයතනය විසින් පුවත් පත් සහ අන්තර්ජාලය හරහා ප්‍රවර්ධන කටයුතු සිදු කල අතර , තෘතික හා වෘත්තිය පුහුණු අධිකාරිය විසින් ප්‍රවර්ධක වැඩසටහන් මගින්ද ප්‍රවර්ධන කටයුතු සිදුකර තිබේ. තව දුරටත් ඉදිරියේදී සිසුන් දැනුවත් කිරීම පුළුල් කිරීමට බලාපොරොත්තු වෙමි. | පාඨමාලාවට සිසුන් බඳවා ගැනීම සඳහා ප්‍රවර්ධන වැඩසටහන් පැවැත්වීම කෙරෙහි අවධානය යොමු කළ යුතුය. |
| (ආ) විද්‍යායතනය විසින් කළමනාකරණ මණ්ඩල හා අධ්‍යයන මණ්ඩල මාසයකට එක් වරක් බැගින් රැස්වීම් පවත්වා තිබුණද ආයතනයේ ප්‍රධාන ගැටළුවක් වන විෂය නිර්දේශයන්හි | අධ්‍යයන අංශ ප්‍රධානීන් සහ පාඨමාලා සම්බන්ධීකාරකවරුන් හරහා විෂය නිර්දේශයන්හි ආවරණය කළ යුතු පැය ප්‍රමාණයන් ආවරණයකිරීම | ආයතනයේ මානව සම්පත කාර්යක්ෂමව උපයෝගී කර ගෙන ආවරණය නොවූ විෂය කොටස් ආවරණය කර |

| | | |
|---|---|---|
| ආවරණය කළ යුතු පැය ප්‍රමාණයන් ආවරණය නොවීම සම්බන්ධයෙන් එම මණ්ඩලවල අවධානය යොමු කළ බවට රැස්වීම් සටහන් අනුව අනාවරණය නොවුණි. | සම්බන්ධයෙන් විසඳුම් ලබාගෙන ක්‍රියාත්මක කල බැවින් විශ්වවිද්‍යාල විද්‍යායතනයේ කළමනාකරණ මණ්ඩල හා අධ්‍යයන මණ්ඩලවල මෙම ගැටලුව සාකච්ඡාකිරීමට තරම් අවශ්‍යතාවයක් පැන නොනැගුණි. | ගැනීම කෙරෙහි අවධානය යොමු කළ යුතුය. |
| (ඇ) සමාලෝචිත වර්ෂයේදී සම්පූර්ණ කරන ලද 2015 හා 2016 වර්ෂවල ආරම්භ කළ පාඨමාලා 05කට අදාළව බඳවා ගත් සිසුන්ගෙන් සියයට 26ත් 100ත් අතර පරාසයක ප්‍රමාණයක් පාඨමාලාව හැරයාමේ ප්‍රවනතාවයක් හා විභාග අසමත් වීමේ ප්‍රවනතාවය සියයට 29 ත් සියයට 100 ත් අතර පැවතුණි. එලෙස ලියාපදිංචි සිසුන් පාඨමාලා හැරයාමට හේතූන් හා විභාග අසමත් වීමට බලපාන හේතූන් කවරේද යන්න සොයාබලා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට කළමණාකරණයේ අවධානය යොමු කර නොතිබුණි. | මෙම තත්ත්වය අවමකරලීම සඳහා උසස් තාක්ෂණ ඩිප්ලෝමාව හා ලබාදෙන පුහුණුවේ වැදගත්කම සම්බන්ධව සිසුන් දැනුවත් කිරීමේ දේශන හා වැඩසටහන් ක්‍රියාත්මක කලද ප්‍රායෝගික හේතු කාරනා මත යම් සීමිත සිසුන් පිරිසක් පාඨමාලාව හැරයාමේ තත්ත්වයක් දැකගත හැකිවේ. සිසුන් විභාග අසමත් වීම සිසුන්ගේ දුර්වලතාවය මත සිදුවන බවත් ඉදිරියේදී දුර්වල සිසුන් වෙත තවදුරටත් දැනුම ලබා දීම තුලින් ඔවුන්ගේ විභාග සමත්වීමේ ප්‍රතිශතය ඉහළ නැංවීමට කටයුතු කරනු ලැබේ. | පාඨමාලා සඳහා බඳවා ගන්නා සිසුන් රඳවා ගැනීමටත්, විභාග අසමත් සිසුන් කෙරෙහි වැඩි අවධානය යොමු කිරීමට කටයුතු කළ යුතුය. |

## 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

-------------------------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2019 පෙබරවාරි සිට ජුලි දක්වා , ක්‍රියාත්මක පළමු සමාසිකය සඳහා පාඨමාලා 09 කට අදාළ න්‍යායාත්මක දේශන පැය 1,238 ක් හා ප්‍රායෝගික පුහුණු පැය 451 ක් බාහිර දේශකයින් 13 දෙනෙකුගෙන් ආවරණය කර ගැනීමට සැලසුම් කර තිබුණද ,ආවරණය කර ගැනීමට හැකි වී තිබුණේ න්‍යායාත්මක දේශන පැය 579.5 ක් හා ප්‍රායෝගික පුහුණු පැය 79 ක් පමණි .ඉන් බාහිර දේශකවරුන් 11 දෙනකු වෙත පැවරී තිබුණු ප්‍රායෝගික දේශන පැය 231.5 කින් එකම පැයක් හෝ ආවරණය කර ගෙන නොතිබුණි. ඒ අනුව පැවැත්වීමට සැලසුම් කර තිබූ දේශන පැය හා ප්‍රායෝගික පුහුණු පැය පිළිවෙලින් සියයට 53ක් හා සියයට 82ක් ආවරණය කර නොතිබුණි. | සුදුසු බාහිර කථිකාචාර්යවරුන්ගේ හිඟය පැවතීම නිසා මෙම තත්ත්වය ඇතිව තිබේ. සමාසිකය අවසාන භාගයේ සිසුන්ගේ අධ්‍යයන කටයුතුවල ගුණාත්මක භාවයට හානි නොවන පරිදි මූලික විෂය කරුණු හා සියලු ප්‍රායෝගික ක්‍රියාකාරකම් නිබන්ධන මාර්ගයෙන් ද ආවරණය කොට තිබේ. | සියලුම විෂයය කරුණු ආවරණය වන පරිදි දේශන හා ප්‍රායෝගික දේශන ක්‍රියාත්මක කළ යුතු ය. |

(ආ) සාමාලෝචිත වර්ෂයේදී ක්‍රියාත්මක වන පාඨමාලාවල NVQ-V හි පළමු සමාසිකය හා NVQ-VI දෙවන සමාසිකයේ විෂයයන් 14 ක දේශන පැය 12,706 ක් හා විෂයයන් 11 ක ප්‍රායෝගික දේශන පැය 239 ක් ආවරණය කර ගැනීමට සැලසුම් කර තිබුණද පිළිවෙලින් දේශන පැය 5,889 ක් හා ප්‍රායෝගික පුහුණු එකදු පැයක් ආවරණය කර ගැනීමට නොහැකි වී තිබුණි.

## 3.3 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ස්වයං චලන තාක්ෂණ අංශය විසින් පවත්වනු ලබන පාඨමාලා ප්‍රායෝගික ක්‍රියාකාරකම් හා සෘජුවම සම්බන්ධ වන බැවින් ඒ සඳහා 2015 වර්ෂයේ මිලදී ගෙන තිබුණු රු.3,425,000ක් වටිනා උපකරණ සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් ස්ථාපිත නොකිරීම හේතුවෙන් සිසුන්ගේ ප්‍රායෝගික පුහුණු ක්‍රියාකාරකම් සිදු කිරීමට නොහැකි වීමෙන් පාඨමාලාවේ ගුණාත්මකභාවය පිරිහෙන බව විගණනයේදී නිරීක්ෂණය විය. | අදාල උපකරණ සවිකිරීම සඳහා ප්‍රමාණවත් බිම් කොටසක් මෙම ආයතනයේ නොමැත. විකල්ප ඉඩමක් ලැබුණු පසුව අදාල උපකරණ නිසි ප්‍රමිතියට අනුව සවිකිරීමට කටයුතු කරමි. | මෙවැනි පාඨමාලාවල ගුණාත්මක භාවය ප්‍රායෝගික ක්‍රියාකාරකම් මත රඳාපවතින බැවින් සිසුන්ගේ ප්‍රයෝගික ක්‍රියාකාරකම්ද උපරිම මට්ටමෙන් පැවැත්වීමට කටයුතු කළ යුතුය. |

## 3.4 ප්‍රසම්පාදන කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සාමාලෝචිත වර්ෂයේ ප්‍රාග්ධන වත්කම් අත්පත් කර ගැනීම සඳහා ලද ප්‍රතිපාදන මුදල ඉක්මවා සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින රු 1,334,794 ක වගකීමකට බැඳි තිබුණි. | 2019 වර්ෂයේ ප්‍රාග්ධන වියදම් සඳහා ප්‍රමාණවත් පරිදි භාණ්ඩාගාරය මඟින් මුදල් නිදහස් නොකිරීම නිසා 2019 වසර තුළ මිළදීගත් ප්‍රාග්ධන භාණ්ඩ කීපයක් සඳහා මුදල් ගෙවීමට නොහැකිවූ අතර, රු. 1,334,794 ක මුදල ණයගැතියන් ලෙස වාර්තා කරන ලදි. | ප්‍රසම්පාදනයන් සිදු කිරීමේදී ලැබී ඇති ප්‍රතිපාදන ප්‍රමාණයන් පිළිබඳ සැලකිලිමත් වෙමින් ප්‍රසම්පාදනයන් සිදු කළ යුතුය. |

**3.5 මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂය අවසානවන විට කථිකාචාර්ය තනතුරු 03ක්, ප්‍රදර්ශක තනතුරු 02ක් ඉංග්‍රීසි උපදේශන තනතුරු 01ක් සහකාර පුස්ථකාලාධිපති තනතුරු 01ක් කළමනාකරණ සහකාර තනතුරු 01ක් හා ආරක්ෂක නිලධාරි තනතුරු 01ක් ඇතුළුව සමස්ථ පුරප්පාඩු 09ක් පැවති අතර එම පුරප්පාඩු පිරවීමට 2020 මැයි 30 දින වන විටත් කටයුතු කර නොතිබුණි. | කඩිනමින් සම්මුඛ පරීක්ෂණ පවත්වා සියළුම පුරප්පාඩු පිරවීමට කටයුතු කරනු ලැබේ. | අවශ්‍ය මානව සම්පත් හඳුනාගෙන පුරප්පාඩු පිරවීමට කඩිනමින් කටයුතු කළ යුතුයි. |

**4. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය**

**4.1 සංයුක්ත සැලැස්ම**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ආයතනයේ පවතින ශක්තීන් , දුර්වලතා, අවස්ථා හා තර්ජන හඳුනාගෙන ඒ අනුව ඉලක්ක පිහිටුවා එම ඉලක්ක ලගා කර ගැනීමට යෝජිත ක්‍රියාමාර්ග ඇතුළත් වන පරිදි සංයුක්ත සැලැස්ම පිළියෙල කර නොතිබුණි. | 2019 වර්ෂය තුළදී සංයුක්ත සැලැස්මක් පිළියෙල කර ඇති අතර එය අවුරුදු පතා යාවත්කාලීන කිරීමට කටයුතු කරනු ලැබේ. | ආයතනයේ දැක්ම මෙහෙවර හා අරමුණු හා පරමාර්ථ පදනම්ව සංයුක්ත සැලැස්මක් සකස් කළ යුතු අතර, වාර්ෂික කාර්ය සාධනය පදනම්ව යාවත්කාලීන කළ යුතුය. |

**4.2 වර්ෂික ක්‍රියාකාරී සැලැස්ම**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) 2014 පෙබරවාරි 17 දිනැති අංක 2014/1 දරන රාජ්‍ය මුදල් චක්‍ර ලේඛය පරිදි විද්‍යායතනය විසින් ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර නොතිබුණි. සමාලෝචිත වර්ෂයට අදාළව සකස් කර තිබූ ක්‍රියාකාරී සැලැස්මේ මෙහෙයුම් ක්‍රියාකාරකම් 18ක් සම්බන්ධයෙන් ප්‍රගති වාර්තා සකස් කර නොතිබීම නිසා ප්‍රගතිය සමාලෝචනයට ලක් කිරීම ද කලමනාකරණය විසින් සිදුකර නොතිබුණි. | ඉදිරියේදී ප්‍රගති සමාලෝචනයක් සිදු කර ප්‍රගතිය අත්සන් කර ගැනීමට අවශ්‍ය උපදෙස් අදාළ අංශ සඳහා ලබාදීමට කටයුතු කරනු ලැබේ | ආයතනයේ කළමනාකරණය විසින් කාලීනව ප්‍රගති සමාලෝචනයක් කර ඉලක්ක ළඟා කර ගෙන නොමැති අංශයන්හි ප්‍රගතිය අත්පත් කර ගැනීමට උපදෙස් හා ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ආ) ඉහත තත්ත්වයන් සැලකීමේදී වර්ෂය තුළ ඉටුවූ ක්‍රියාකාරකම් ක්‍රියාකාරී සැලැස්මට අනුගතව සිදු කළේද යන්න හා කළමනාකරණය විසින් බලාපොරොත්තු වූ පරිදි සැලසුමේ ඉලක්ක ඉටු වුයේද යන්න පසු විපරමකට ලක් වී නොතිබුණි. | නිසිපරිදි ලිපිගොනු තබා ගනිමින් ප්‍රගති සමාලෝචනයක් සිදුකිරීමට කටයුතු සලස්වනු ලැබේ. | විගණිත දිනයට පසු විපරමක් සිදුවූ බවට කිසිදු ලේඛනයක් වාර්තාවක් විගණනයට ඉදිරිපත් නොවූ අතර, එසේ ඇගයීමක් කරන්නේ නම් ඒ වෙනුවෙන් වාර්තාවන් පිලියෙල කළ යුතුවේ. |

**4.3** අභ්‍යන්තර විගණනය

------------------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ 133 වන රෙගුලාසිය ප්‍රකාරව විශ්වවිද්‍යාල විද්‍යායතනයෙහි අභ්‍යන්තර විගණන ඒකකයක් පිහිටු වීමට කටයුතු කර නොතිබුණු අතර, වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර විගණන අංශයෙන්ද විගණනයක් සිදුකර නොතිබුණි. | අප ආයතනයේ අභ්‍යන්තර විගණකවරයෙකු නොමැති බැවින් අභ්‍යන්තර විගණන ඒකකයක් පිහිටුවීමට නොහැකිව තිබේ. එබැවින් අභ්‍යන්තර විගණනයක්ද සිදු කිරීමට නොහැකි වී තිබේ. | මුදල් රෙගුලාසි ප්‍රකාරව අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කර විගණනය කළ යුතුය. |

**4.4** විගණන කමිටු

-----------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2010 දෙසැම්බර් 14 දිනැති අංක පී.ඊ.ඩී. 55 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය ප්‍රකාරව විද්‍යායතනයේ කළමනාකරණ මණ්ඩලය විසින් විගණන හා කළමනාකරණ කමිටු ස්ථාපිත කිරීමට කටයුතු කර නොතිබූ අතර පසුගිය වර්ෂයේ විගණකාධිපති වාර්තාවේද මේ සම්බන්ධයෙන් අවධානය යොමුකරන ලදී. | අප ආයතනය තුළ විගණන හා කළමනාකරණ කමිටුවක් නොමැති බැවින් 2017 වර්ෂය සඳහා වෘත්තීය තාක්ෂණ විද්‍යාලයේ පැවැති විගණන හා කළමනාකරණ කමිටුවට අනුබද්ධකර විගණන හා කළමනාකරණ කමිටු පවත්වන ලදී. | වෘත්තීය තාක්ෂණ විද්‍යාලයට අනුබද්ධව විගණන හා කළමනාකරණ කමිටු පැවතියත් ඒ සඳහා ආයතනයේ ඉහළ කළමනාකරණයේ සිටින නිලධාරීන් සහභාගී විය යුතු අතර ආයතනයේ කටයුතු වලට අදාළව සාකච්ඡාවන් සිදු කල යුතුය. |

**5. තිරසාර සංවර්ධන අරමුණු**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| එක්සත් ජාතීන්ගේ සංවිධානයේ 2030 තිරසර සංවර්ධන න්‍යාය පත්‍රය ප්‍රකාරව මාතර විශ්වවිද්‍යාල විද්‍යායතනයේ ලඟාකරගත යුතු අරමුණු හා ඉලක්ක හදුනා ගැනීම හා එකී සංවර්ධන අරමුණු හා ඉලක්ක මැනීම සඳහා දර්ශක හදුනා ගැනීම, සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් සිදු වී නොතිබුණු බව නිරීක්ෂණය විය. | 2018 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මේ තිරසාර සංවර්ධන ඉලක්ක සමඟ ඇති සම්බන්ධතාවය පැහැදිලි ලෙස ඉදිරිපත් කර නොමැති බැවින් 2018 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් ක්‍රියාකාරකම් තිරසර සංවර්ධන ඉලක්ක සමඟ ඇති සම්බන්ධතාවය දක්වන ලේඛනයක් මේ සමඟ ඉදිරිපත් කරමි. | ක්‍රියාකාරී සැලැස්මට තිරසර සංවර්ධන ඉලක්ක ඇතුළත් කර ආයතනයේ අරමුණු සමඟ තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමට ක්‍රියා කිරීමට කටයුතු කළ යුතුය. |